# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ඩීසල් බහු ආංශික ඒකක (Diesel Multiple units) පහක් (05) සැපයීමේ ප්‍රසම්පාදනය - SRS/F. 8156

1. ශ්‍රී ලංකාවේ, කොළඹ, ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන්, ප්‍රවාහන මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ඉහළ තලයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, ජාත්‍යන්තර නිෂ්පාදකයන්/ සැපයුම්කරුවන් වෙතින් ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ඩීසල් බහු ආංශික ඒකක 05ක් සැපයීම සඳහා මුද්‍ර, තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ. භාණ්ඩ ප්‍රසම්පාදනය සඳහා වන අදාළ ලංසු ලේඛන, ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය විසින්, 2016 දෙසැම්බර් මස ආසියානු සංවර්ධන බැංකුව විසින් නිකුත් කළ භාණ්ඩ ප්‍රසම්පාදනය සඳහා වන සම්මත ලංසුලේඛනමත පදනම්ව සකස්කොට ඇත. අදාළ ලංසු ලේඛන 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 5.3 වගන්තියෙහි සී උපවගන්තියෙහි 05 ඡේදය ප්‍රකාරව භාවිත කෙරේ.

3. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්ට 2026.06.08 සිට 2026.07.20 දක්වා සතියේ දිනවල වැඩ කරන දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ පහත දක්වා ඇති ලිපිනයෙන් ලංසු ලේඛන පරික්ෂා කිරීමට සහ වැඩිදුර තොරතුරු ලබා ගැනීමට හැකිය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කට් මාවත. කොළඹ 10, ශ්‍රී ලංකාව,**

| | | |
|---|---|---|
| **දුරකථන අංක** | : | **94 (11) 2438078 හෝ + 94(11) 4600202** |
| **ෆැක්ස් අංකය** | : | **94 (11) 2432044** |
| **ඊමේල්** | : | **srs.slr@gmail.com, tender1.srs/gmail.com** |
| **වෙබ් අඩවිය** | : | **www.railway.gov.lk** |

4. ආපසු ගෙවනු නොලබන ගාස්තු රුපියල් 500.000.00 හෝ සමාන නිදහසේ හුවමාරු කළ හැකි මුදල් වර්ගයකින් ගෙවීමෙන් හා ඉහත ලිපිනය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් 2026.06.08 දින සිට 2026.07.20 දින දක්වා, නැතහොත් 2026.07.20 දින ප.ව. 3.00 දක්වා (ශ්‍රී ලංකා වේලාවෙන්) ශ්‍රී ලංකා විදේශ තානාපති කාර්යාලවලින්, උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට ඉංග්‍රීසි භාෂාවෙන් සකස්කළ සම්පූර්ණ ලංසුලේඛන කට්ටලයක් මිලදී ගත හැක.

5. ලංසුකරුවන් විසින්, ලංසු ලේඛනයන්හි කොන්ත්‍රාත්තුමය හා තාක්ෂණ පලපුරුද්ද 3.2.2 වගන්තිය ප්‍රකාරව තමන්ගේ හැකියාව හා ශක්‍යතාව ලේඛනගත සාක්ෂි මගින සනාථ කළ යුතුය.

6. ලංසු 2027.01.12 දින දක්වා (ලංසු විවෘත කළ දින සිට දින 175) වලංගු විය යුතුය.

7. ලංසුකරු විසින්, ඇමරිකන් ඩොලර් 660,000 හෝ සමාන ශ්‍රී ලංකා මුදලින් හෝ නිදහසේ හුවමාරු කළ හැකි වටිනාකමින් යුත් මුදල් වර්ගයකින්, ශ්‍රී ලංකා මහබැංකුව විසින් අනුමත කළ මෙරට බැංකුවකින් හෝ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවක් විසින් ප්‍රති - සහතික කළ ජාත්‍යන්තර ප්‍රසිද්ධ බැංකුවක් වෙතින් ලබාගත් බැංකු ඇපකරයක් ලෙසට වූ ලංසු ඇපකරයක් බැගින් ඉදිරිපත් කළ යුතුය.

8. මේ සම්බන්ධ පෙර ලංසු රැස්වීමක් 2026.06.23 දින පෙ.ව. 10.00ට ශ්‍රී ලංකාවේ, බත්තරමුල්ල, සෙත්සිරිපාය අදියර II, 7 වන මහල, ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ, ලේකම්වරයාගේ කාර්යාලයේදී පැවැත්වීමට නියමිතය.

9. ලංසු පහත සඳහන් ලිපිනය වෙත, 2026.07.21 දින ප.ව. 2.00 පෙර ලැබීමට සැලැස්විය යුතුය. ලැබී ඇති ලංසු අදාළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්හට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්හට එම අවස්ථාවට පැමිණ සිටින ලෙසට ඉල්ලීමක් කෙරේ. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ.

**සභාපති,**
**ඉහළ තලයේ ප්‍රසම්පාදන කමිටුව,**
**ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය,**
**7 වන මහල, සෙත්සිරිපාය අදියර II, බත්තරමුල්ල.**

**යොමු අංකය - SRS/F. 8156**

**සභාපති,**
**ඉහළ තලයේ ප්‍රසම්පාදන කමිටුව.**